තොරතුරු තාක්ෂණ අංශයෙන් බබළන
පානකාව මහා විද්‍යාලය

2010 වසර පානකාව මහා විද්‍යාලයට අති විශේෂයි. ඒ හේතු දෙකක් නිසයි. පළමු හේතුව වන්නේ පානකාව පාසල් මැණියන් වයස අවුරුදු 100 සපුරා පරිණත භාවයේ කිරුල පැලඳවීම. දෙවැන්න වන්නේ තොරතුරු තාක්ෂණ අංශයෙන් නිසාම තම නාමය ජාත්‍යන්තර තලයට ගෙනයාමට හැකිවීම. මේ වන විට තොරතුරු තාක්ෂණ අංශයේ තරග වලින් සමස්ත ලංකා ජයග්‍රහණ 4 ක් හා විදේශ තරග දෙකකට සහභාගිවීමේ වරම් ලැබී තිබෙනවා. මේ ජයග්‍රහණ නිසාම තායිලන්තය, සිංගප්පූරුව හා දකුණු කොරියාව යන රටවලට අධ්‍යයන ශිෂ්‍යත්ව තුනක් අපට ලැබුණා.

පානකාව මහා විද්‍යාලය ආරම්භවන්නේ සිසුන් 23 දෙනෙකුගෙන් 1910 වර්ෂයේදීයි. ආරම්භක විදුහල්පති පී. ඒ ප්‍රනාන්දු මහතායි. ආරම්භක උපගුරුවරිය J. A. P. බස්නායක මහත්මියයි. පාසල ආරම්භයේ දි පොල් අතු සෙවිලි කළ එක් ගොඩනැගිල්ලක් පමණක් විය.

පාසලේ සුවිශේෂම කාලය වන්නේ පූජ්‍ය රත්ගම විපස්සී හිමිපාණන් විදුහල්පති ලෙස පාසලට පැමිණීමත් සමඟය. දෙමහල් ගොඩනැගිල්ලක් ඇතුළුව ගොඩනැගිලි 6 ක් දක්වා වර්ධනය වන්නේ මේ කාලයේ දී ය. එමෙන්ම මෙතෙක් සේවය කළ විදුහල්පතිවරුන්,ගුරුභවතුන් හා දෙමාපියන්ගේ මහන්සිය මත අද දක්නට ලැබෙන පාසල ගොඩනැගී ඇත.

පානකාව මහා විද්‍යාලය තොරතුරු තාක්ෂණ අංශයෙන් මෙතරම් ඉහළට වර්ධනය වීමට උදව් කරන්නේ කවුරුද යන්න ගැන කථා කළ යුතුමය. 1998 SEMP iiව්‍යාපෘතිය මගින් පරිගණක 20 සහිත අංග සම්පූර්ණ පරිගණක විද්‍යාගාරයක් ලබා දෙනවා. එය තමයි අපේ ස්ථාවර පදනම. ඒ විතරක් නොවෙයි, SEMP ii ව්‍යාපෘතිය මගින් අපේ පාසලේ සියලුම ගුරු භවතුන් CAL, ICDL පුහුණුව මගින් පරිගණක පුහුණුව ලබා දී පරිගණක දැනුමෙන් සන්නද්ධ කරනවා.

පරිගණක පුහුණුව ලැබූ ගුරුභවතුන් පරිගණක විද්‍යාගාරය උපයෝගි කරගෙන ඉගෙනුම් ඉගැන්වීම් කාර්ය කරගෙන ගියා. මෙය අපේ පාසලට සුවිශේෂයි.

මේ අතර තමයි 2009 වසරේ අපේ පාසලේ ගුරුභවතුන් දෙදෙනෙකුට Intel Teachපාඨමාලාව හැදෑරීමට වරම් ලැබෙනනේ. ඔවුන් දෙදෙනා අප පාසලේ සියලු ගුරු භවතුන්ට මේ පුහුණුව ලබා දෙනු ලැබුවා. මේ පුහුණුව අපට සුවිශේෂයි. මේ වන විට අපේ පාසලේ බොහෝ ගුරු භවතුන් ඉගෙනුම් ඉගැන්වීම් කාර්ය සඳහා පරිගණක ඒකකය භාවිතා කරමිනුයි තිබුණේ. එහෙත් Intel Teach පාඨමාලාව හැදෑරීමෙන් පසු පාඩම් පරිගණකයෙන් ඉගැන්වීම සඳහා පාඩම් සැලසුමට පරිගණකයෙන් කළ හැකි ශිෂ්‍ය ක්‍රියා කාරකම් එකතු කරමින් සාර්ථක පාඩමක් ගොඩ නැගීමට හැකිව ලැබුණා. සිසුන් ද ක්‍රියාකාරකම් සහිත පාඩම් වලට වැඩි කැමැත්තක් දක්වනවා.

අප පාසල තොරතුරු තාක්ෂණ අංශයේ සියලුම තරග වලින් සෑම අවුරුද්දකම ජයග්‍රහණය ලබනවා. මේ ජයග්‍රහණ සඳහා Intel Teach පාඨමාලාව උපකාරි වූ බව කිව යුතුයි. ආසන්නම වර්ෂය වන 2010 පළාත් අධ්‍යාපනික මෘදුකාංග තරගා වලියේ දි ජයග්‍රහණ 18 අප පාසල දිනා ගනු ලබනවා.

2010 පළාත් අධ්‍යාපනික මෘදුකාංග තරගා වලියේ දි ජයග්‍රහණ ලබා ගත් ගුරු හා සිසු කණ්ඩායම

සමස්ත ලංකා ජයග්‍රහණ 4 ක් මේ වන විට අප ලබා ලබාගෙන තියෙනවා. Partners in Learning Innovative Teachers'-2009 සමස්ත ලංකා තරගාවලියේ දි උසස් පෙළ අංශයේ ප්‍රථම ස්ථානයත් සිංගප්පූරුව හා තායිලන්තයයේ අධ්‍යයන ශිෂ්‍යත්ව ලැබූ අප පාසලේ පරිගණක අංශය භාරව කටයුතු කරන ආචාර්ය එම්. ඩී. සුනිල්රත්න මහතා Intel Teach පාඨමාලාව ගැන දක්වන්නේ මෙවැනි අදහසක් "පරිගණකය ඇසුරින් ඉගෙනුම් ඉගැන්වීම් කාර්ය සඳහා ගුරුභවතුන් යොමු කිරීමේදීත් ගුරුභවතුන් පුහුණු කිරීමේදීත් මෘදුකාංග නිර්මාණයේ දීත් Intel Teach පාඨමාලාව මට මහත් පිටිවහලක් වුණා. "

සමස්ත ලංකා ජාතික මට්ටමේ පාසල් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශූරයෝ තරගාවලියේ නිර්මාණාත්මක ගුරුවරු 2009 ප්‍රථම ස්ථානය දිනාගත් දකුණු කොරියාවට අධ්‍යයන ශිෂ්‍යත්වයක් ලැබූ A.N.M අතාවුද ගුරු මහත්මියගේත් සමස්ත ලංකා ජාතික මට්ටමේ පාසල් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශූරයෝ තරගාවලියේ නිර්මාණාත්මක ගුරුවරු 2010 දෙවන ස්ථානය දිනාගත් බී. ආර් ධනවතී ගුරු මහත්මියගේත් අදහස වන්නේ තම ජයග්‍රහණ සඳහා පාසලෙන් ලැබුණ මගපෙන්වීමත් Intel Teach පාඨමාලාවත් උපකාරී වූ බවයි.

A. N. M අතාවුද ගුරු මහත්මිය

බී. ආර් ධනවතී ගුරු මහත්මිය

එම්. ඩී. සුනිල්රත්න මහතා

සබ/කෑග/ පානකාව මහා විද්‍යාලය, පානකව.